# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2087/95 - 2018 සැප්තැම්බර් මස 08 වැනි සෙනසුරාදා - 2018.09.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

### මධ්‍යම පළාතේ පළාත් සභාව 2007 අංක 1,510/43 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති මධ්‍යම පළාත් සභාවේ 2003 අංක 02 දරන මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ ඇතුළත් වගන්ති සංශෝධනය කිරීම

මධ්‍යම පළාතේ පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලි බල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය එදිරිවීර වීරවර්ධන වන මම මධ්‍යම පළාත් සභාවේ 2003 අංක 2 දරන මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ V වන කොටසේ අංක 22(1) වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව, 2007 අගෝස්තු මස 17 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති මධ්‍යම පළාතේ 2003 අංක 02 දරන මධ්‍යම පළාතේ මාර්ග සංවර්ධන අධිකාරි ප්‍රඥප්තියේ III කොටසේ 10 (1) වගන්තිය සහ 10(4) වගන්තිය 2018.09.01 දින සිට බල පැවැත්වෙන සේ පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

| | | |
|---|---|---|
| වගන්තිය 10 (1) | දැනට පවතිත වගන්තිය | අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ ලියවිල්ලකින් වූ අනුමැතිය ඇතිව අධිකාරිය සඳහා සාමාන්‍යාධිකාරිවරයෙකු පත් කරනු ලැබිය යුතු ය. |
| | සංශෝධනය විය යුතු ආකාරය | අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව සුදුසුකම් සපුරා ඇති අයෙකු විධිමත් පරිදි සාමාන්‍යාධිකාරි ලෙස පත් කරනු ලැබිය යුතු ය. |
| වගන්තිය 10 (4) | දැනට පවතින වගන්තිය | අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතිය නොමැතිව සාමාන්‍යාධිකාරවරයා ධූරයෙන් ඉවත් කරනු නොලැබිය යුතු ය. |
| | සංශෝධනය විය යුතු ආකාරය | 4 වගන්තිය ඉවත් කෙරේ. |

එදිරිවීර වීරවර්ධන,
මධ්‍යම පළාත් සභාවේ මාර්ග සංවර්ධන, ප්‍රවාහන,
විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය,
මධ්‍යම පළාත.

09 - 640


1A - G 28481 — 22 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*